# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 6 දරන පළාත් සභා
## (මුද්දර ගාස්තු මාරු කිරීමේ)
## (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 පෙබරවාරි මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 9.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2022 අංක 6 දරන පළාත් සභා**
**(මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 33/2021

**2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ)**
**පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2011 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) 2 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) එම වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

"අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු විසින්—

(අ) නිසි ලෙස ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඉක්මවා මුද්දර ගාස්තු ගෙවා ඇති බවට; හෝ

(ආ) එම මුද්දර ගාස්තු අදාළ වන සාධන පත්‍රයක් මත වැරදි සහගත ලෙස මුද්දර ගාස්තු ගෙවා ඇති බව සහ 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ එවැනි මුද්දර ගාස්තුවක් ගෙවීමට ඔහු බැඳී නොසිටින බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි, ලිඛිතව සිදු කරනු ලබන ඉල්ලීමකින් ඔප්පු කරනු ලබන එම තැනැත්තා වෙත, පළාත් සභා වෙත මාරු කරනු ලැබීමට පෙරාතුව වූ යම් කාලසීමාවක් තුළ දී මුද්දර ගාස්තු වශයෙන් එකතු කරන ලද මුදලින්, එසේ ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය.”; සහ

(3) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:—

“(2) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ ආපසු ගෙවීම සඳහා වූ සියලු ඉල්ලීම් සඳහා අදාළ වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා “කොමසාරිස් ජනරාල්වරයා” යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඒ සඳහා ඇති අර්ථයම තිබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.